# සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවයට පාසල් සංස්කෘතියේ දායකත්වය පිළිබඳ අධ්‍යයනයක්

# A study on the contribution of school culture towards qualitative general education

ටී.පී.එච්.එන්.ජයන්ත අමරසූරිය

ශාස්ත්‍රවේදි උපාධි (පේරාදෙණිය විශ්ව විද්‍යාලය)1995
ඉංග්‍රිසි පුහුණු (ජාතික අධ්‍යාපන ආයතනය) 1997
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා(පේරාදෙණිය විශ්ව විද්‍යාලය)2000
සමාජීය විද්‍යාපති උපාධි (කැළණිය විශ්ව විද්‍යාලය)2004
අධ්‍යාපනපති උපාධි(පේරාදෙණිය විශ්ව විද්‍යාලය)2008

ලියාපදිංචි අංකය:-2010/M phil/S/10

University of Colombo Library Sri Lanka

**අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයට ඉදිරිපත් කරනු ලබන නිබන්ධය - 2016**

UCLIB
588072

# සංක්ෂිප්තය

සාමාන්‍ය අධ්‍යාපනය හෙවත් පාසල් අධ්‍යාපනය පිළිබඳ තබා ඇති ජාතික අධ්‍යාපන අරමුණු අපේක්ෂිත අයුරින් ඉටු නොවීම බලාපොරොත්තු කඩවීමක් මෙන්ම අධ්‍යාපන පද්ධති ක්‍රියාකාරීත්වය පිළිබඳ පවතින දුර්වලතාව ප්‍රදර්ශනය වීමකි. වාර්ෂිකව ජාතික ආදායමෙන් සැලකිය යුතු මුදලක් අධ්‍යාපනය සඳහා අයෝජනය කළ ද අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි බව විවිධ වාර්තා මගින් ද අනාවරණ කරයි. පාසල් සංස්කෘතිය හෙවත් පාසලේ හඬ නො නගන නීතිය පාසල සමග පවත්වා ගන්නා සම්බන්ධතාව දුර්වල වීම මගින් මෙවන් තත්ත්වයක් නිර්මාණය වීමට ඉඩ ප්‍රස්තා ඇති බව විශ්වාස කළ පර්යේෂකයා තම කල්පිතය පරීක්ෂා කිරීම සඳහා ''සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවයට පාසල් සංස්කෘතියේ දායකත්වය පිළිබඳ අධ්‍යයනයක්'' යන මාතෘකාව ඔස්සේ පර්යේෂණය දියත් කරන ලදි.

පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනය සඳහා පාසල් සංස්කෘතිය දක්වා ඇති දායකත්වය නියැදිගත පාසල් 30ක් හා නියැදි ජනගහනය 480ක් පදනම් කර සොයා බැලීමටත් එයින් අනාවරණය වන යථාර්ථය නව දැනුමක් ලෙස සාමාන්‍ය අධ්‍යාපනයේ සංවර්ධනයට දායක කර ගැනීමට හැකි ආකාරය යෝජනා කිරීමත් අරමුණු කොට පර්යේෂණය දියත් කරන ලදි. දේශීය හා විදේශීය පර්යේෂණ සාහිත්‍යය පුළුල් ලෙස අධ්‍යයනය කරමින් පාසලේ සංස්කෘතිය පිළිබඳවත් අධ්‍යාපනයේ ගුණාත්මකභාවයට එහි ඇති බලපෑමත් පිළිබඳ ගවේෂණය කර දැනුම් ක්ෂෙත්‍ර තුනක් හඳුනා ගන්නා ලදි. එම ක්ෂෙත්‍ර අතර දොළොස් වැදැරුම් පාසල් සංස්කෘතික ආදර්ශ, පාසල් සංස්කෘතික මූලධර්ම ත්‍රිත්වය සහ පාසල් සංස්කෘතික ස්තර ත්‍රිත්වය ප්‍රධාන විය. මෙම දැනුම කේන්ද්‍ර කර ගනිමින් පර්යේෂණ සංකල්ප රාමුව සැකසීම, පර්යේෂණ අරමුණු, නියැදි තීරණය කිරීම හා නියැදි ජනගහනය හඳුනා ගැනීම, උපකරණ සකස් කිරීම, දත්ත රැස්කිරීම, විශ්ලේෂණය හා අර්ථ දැක්වීම සිදු කරන ලදි.

පර්යේෂණ අරමුණු හතරක් යටතේ ප්‍රධාන පර්යේෂණ ප්‍රශ්න 12ක් හා සුවිශේෂී ප්‍රශ්න හා ප්‍රකාශ භාවිත කරමින් දත්ත රැස්කරන ලදි. පර්යේෂණයේ වලංගුතාව හා විශ්වශ්‍යතාව තහවුරු වන පරිදි අධ්‍යාපනික වශයෙන් විවිධත්වයක් ඇති අනුරාධපුර හා මහනුවර අධ්‍යාපන කලාප දෙකෙහි 1ඒබී, 1සී, හා 2 වර්ගයට අයත් බාලක, බාලිකා හා මිශ්‍ර පාසල් 30ක් ඇසුරින් පර්යේෂණය දියත් කරන ලදි. එම පාසල්වල විදුහල්පතිවරු ද පාසලකින් පස්දෙනා බැගින් ගුරුවරු 150ක් ද පාසලකින් දසදෙනා බැගින් සිසුන් 300ක් ද වශයෙන් මුළු නියැදි ජනගහනය 480ක් පර්යේෂණය සඳහා යොදාගන්නා ලදි.

පළමු පර්යේෂණ අරමුණ මගින් පාසල් සංස්කෘතියට හේතුවන සංස්කෘතික ආදර්ශ හඳුනා ගැනීමත්, ඒ පිළිබඳ නියැදි ජනගහනය සතු දැනුම පරීක්ෂා කිරීමත් සිදුකරන ලදි. අදාළ දත්ත විශ්ලේෂණය කිරීමේ දී අදාළ ප්‍රස්තුතය පිළිබඳ නියැදි ජනගහනය සතු දැනුම හා අවබෝධය ගුණාත්මක අධ්‍යාපනයකට ළඟා වීමට තරම් ප්‍රමාණවත් නොවන බව තහවුරු විය. දෙවන පර්යේෂණ අරමුණ මගින් පාසලේ පරිපාලනය ප්‍රධාන අධ්‍යයන කාර්ය මණ්ඩල පාසලේ සංස්කෘතික මූලධර්ම ත්‍රිත්වයට අයත් කරුණු අනුගමනය කරන්නේ ද යන්නත් එසේ අනුගමනය

කරන්නේ නම් එක් එක් පාසල්, පාසල් සංස්කෘතිය පිළිබඳව ස්වයං ඇගයීම් දර්ශකයට අනුව ලබා ඇති ලකුණු මට්ටම පාසල් සංස්කෘතික හිණිමගේ අත්කරගෙන ඇති ස්ථාන සොයා බලන ලදි. එහි දී එක් එක් පාසල ලබා ඇති සංස්කෘතික දියුණුවත් අධ්‍යාපනික වශයෙන් අත්කරගෙන ඇති ගුණාත්මක සංවර්ධනයත් සංසන්දනාත්මකව පරීක්ෂා කරන ලදි.

පර්යේෂණයේ තෙවන අරමුණ වූයේ පාසල් සංස්කෘතික ස්තර ත්‍රිත්වයට අයත් කරුණු පාසලේ ගුණාත්මක සංවර්ධනයට කෙතෙක් දුරට දායක වී තිබේ ද යන්න සොයා බැලීමයි. නියැදි ජනගහනය එම කරුණු සඳහා දැක් වූ ප්‍රතිචාර විශ්ලේෂණයේ දී නියැදිගත පාසල් බොහොමයක් තුළ සංස්කෘතික ත්‍රිත්වයට අයත් කරුණු සාර්ථකව ක්‍රියාත්මක නොවන බවත්, එම අංග ලක්ෂණ හොඳින් ක්‍රියාත්මක වන පාසල් නියැදියේ අනෙක් පාසල්වලට වඩා අධ්‍යාපනය තුළ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් අත්කරගෙන ඇති බවත් තහවුරු විය.

පාසල් සංස්කෘතියේ ම කොටසක් වන පාසල් වාතාවරණය පිළිබඳ ධනාත්මක ප්‍රතිරූපයක් නිර්මාණය වීමට දායක වී ඇති ආකාරය සිව්වන අරමුණෙන් සොයා බලන ලදි. පාසල් වතාවරණය එක් එක් පාසලට අනන්‍ය වූවක් වන අතර එය යහපත් අයුරින් පවත්වා ගන්නා පාසල් යහපත් ඉගෙනුම් වාතාවරණයකට හිමිකම් කියන අතරම ඒ තුළින් පාසල පිළිබඳ ධනාත්මක ප්‍රතිරූපයක් ද ගොඩනගා ගෙන ඇති බව තහවුරු විය.

ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ ෂෙඩියුල මගින් ලබාගත් දත්ත ත්‍රිකෝණීකරණය වන අයුරින් විශ්ලේෂණය කරමින් තහවුරු කරගත් අනාවරණ මගින් පවතින තත්ත්වය පිළිබඳ නිගමන දැක්වීමත්, සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මක බව වර්ධනය කර ගැනීම සඳහා යෝජනා ද ඉදිරිපත් කරමින් පර්යේෂණය නිමා කරන ලදි.

# Abstract

It is a cause of frustration and a disclosure of the weak functioning of the educational system as well, to learn that the National educational objectives on general education or the school education have not been achieved as anticipated. It has been revealed by numerous reports that the quantitative as well as the qualitative development of education is not in a satisfactory level although a considerable amount of the national income annually invested on education. Believing that the weak relationship between the school and the school culture or the silent rule of the school had created these circumstances the researcher has launched his research titling: "a study on the contribution of the school culture for qualitative development of general education".

The research is carried out as to how school culture contributed to the qualitative and quantitative development of education taking 30 sample schools and 480 sampling population and to suggest to use its real outcome as a new knowledge for developing the general education. In depth study of local and foreign research literature has been carried out on the school culture and its influence on the qualitative development of education and identified three knowledge fields. Within these fields the 12fold school culture models, the school cultural principles trinity and the three school cultural layers became important. Based on this knowledge the Research concept framing, research objectives, deciding the samples, identifying the population, equipment preparation, data collection and analysis and interpretation were taken place.

Data collection was done under four research objectives using 12 main research questions, and specific questions and statements. Research was launched with 30 schools consisting of boys schools, girls schools and mixed schools categorized as 1AB, 1C, and 2 in two educationally different zones of Anuradhapura and Kandy to conform the validity and the credibility of the research. The total population engaged in the research was 480 individuals including the principals, 150 teachers from 30 schools from 5 each and 300 students.

By the first research objective, identification of the cultural models that affect the school culture was done consequently testing the knowledge of the sample population in that regard. It has been revealed through analysis of data that the sample population was not of sufficient knowledge and awareness of the relevant subject to reach the qualitative

education. In the second research objective the researcher tried to ascertain whether the main educational staff inclusive of the administration had followed the matters in the cultural educational trinity and if followed, to what level each school reached in the school cultural ladder as per the self-assessment indicator. Accordingly it has been comparatively examined the cultural development and the qualitative development of education achieved by the each school.

The third objective of the research was to find out as to what extent the matters in the three school layers contributed towards the qualitative development of the school. It was revealed through analysis of the responses of the population that the matters in the three school layers have not been effectively executed in most of the sampling schools. However it was realized that the schools where the matters in three school layers properly executed, had achieved a considerable amount in qualitative and quantitative educational development in comparison with the rest of the schools.

By the fourth objective it was examined the contribution for the creation of a positive image on the school environment which is necessarily a part of the school culture. School environment can be considered as exclusive for each school and the schools maintained the environment in an appropriate manner, had shown a sound learning environment and building a positive image on the school.

The research was concluded by analyzing data received by way of questionaires, interviews and observation schedules making a triangle among them and giving conclusions on the circumstances and giving suggestions for the improvement of general educational development.